(02)

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව
11 JUN 2025
... - බලන්ගොඩ

2025.06.11

ලේකම් මඟින්,

ගරු සභාපති

<u>විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව</u>

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

ඒ.ආර්.එස්.එස්.අත්තනායක,

කළමනාකරණ සේවා නිලධාරී (AC04)

AC/04,
ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරන්න.

සභාවට ඉදිරිපත් කරන්න

2025/06/19 වන දින පැවති මාසික මහ සභා රැස්වීමේදී යථා පරිදි කල් දී ඇති යෝජනා තීරණ අංක 06 (VII) යටතේ සභාගත කරන ලදී. ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (I) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මහා සභාව විසින් සභා සම්මත විය.

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/IMPS/05/2024/FA/07 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 16 දින.

ලේකම්,

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලද මෝටර් රථ අලුත්වැඩියා වියදම් රු.528,750ක් ප්‍රාග්ධනීත කර තිබීමෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් ආයක වීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම කරන ලද අලුත්නුවර ජල යෝජනා ක්‍රමය සඳහා වැයකළ රු.285,010ක් ගිණුම්ගත කර නොතිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම සහ ජංගම බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. එමෙන්ම එම කර්මාන්තය ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජල ගාස්තු බිල් කිරීම් රු.2,472,151ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් මෙහෙයුම් අතිරික්තය හා ජංගම වත්කම් (ලැබිය යුතු ආදායම්) එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) ගිණුම් විෂයයන් 04කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.2,714,524ක වෙනසක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| (i) | 24 වන වගන්තිය සහ 2023 ජනවාරි 24 දින සබරගමුව පළාත් ආණ්ඩුකාරවර විසින් නිකුත් කරන ලද සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් කටයුතු සඳහා කාර්යය පටිපාටිය | - | 2023 ජනවාරි 24 දින සිට මාස දොළහක කාලයක් තුල ප්‍රාදේශීය සභාව සතුව ඇති පාරවල් හා පටුමාවත්, ස්ථිර ලකුණු හා සීමා ලකුණු කිරීම, සැලැස්මවල් පිළියෙල කිරීම හා පාරවල් හා පටු මාවත්වල නාම ලේඛන දක්වමින් දැන්වීම පල කළ යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් සභා බල ප්‍රදේශය තුල මුළු පාරවල් හා පටුමාවත් සම්බන්ධ නියෝගය පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) | 85 වගන්තිය | 490,000 | සබරගමුව විශ්වවිද්‍යාලයට අයත් පඹහින්න මන්සන්ධියට ආසන්න ඉඩමේ 2014 වර්ෂයේදී ඉදිකරන ලද පොදු වැසිකිලිය සභාව වෙත පවරා ගෙන නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iii) | 127 වගන්තිය | - | සභා සීමාවේ පවතින සුසාන භූමි 133ක අයිතිය පවරා ගැනීමට හා අනවසර පදිංචිකරුවන්ගේ ග්‍රහණයට ලක්වීමේ අවධානම අවම කර ගැනීම සඳහා ඒවායේ මායිම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | - | නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(5) වගන්තිය | 3,998,332 | 2002 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු අත්තිකාරම 106ක් 2025 අප්‍රේල් වන විටත් පියවා නොතිබුණි. |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය හා 2005 ජූනි 01 දිනැති අංක 2005/4 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 3(x) වගන්තිය | - | 2023 වර්ෂයේදී සිදු කර තිබුණු ඉඩම් වෙන්දේසියකට අදාළව තාවකාලික තක්සේරුව මත පදනම්ව සියයට 01ක ගාස්තුව අයකරගෙන තිබුණද, විකුණන ලද ඉඩම්වල තථ්‍ය වටිනාකම හඳුනාගෙන තවදුරටත් අයවිය යුතු හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,049,119ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,680,873ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2024 ඇස්තමේන්තුගත ආදායම | 2024 බිල්කළ ආදායම | 2024 රැස්කළ ආදායම | 2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,698,468 | 1,385,727 | 1,382,093 | 96,574 | 2,958,337 | 1,047,965 | 1,126,452 | 97,516 |
| කුලී | 6,655,000 | 4,571,907 | 4,505,707 | 715,575 | 5,115,480 | 4,537,460 | 4,544,640 | 638,375 |
| බලපත්‍ර ගාස්තු | 1,036,000 | 1,332,380 | 1,371,969 | - | 1,851,000 | 1,112,976 | 1,097,776 | 15,200 |
| වෙනත් ආදායම් | 14,336,533 | 19,842,148 | 20,677,856 | 6,249,610 | 8,200,000 | 8,644,414 | 10,239,619 | 7,168,690 |
| | 23,726,001 | 27,132,162 | 27,937,625 | 7,061,759 | 18,124,817 | 15,342,815 | 17,008,487 | 7,919,781 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.7,919,781ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.27,132,162ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.35,051,943ක් වුවද, රැස් කරන ලද ආදායම රු.27,937,625ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු ආදායම සමස්ථ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 20ක මට්ටමක පැවැතිණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු සහ සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 32කින් හා 21කින් වැඩි වී තිබුණු අතර, වරිපනම් හා බදු, බදු කුලී ආදායමවෙනත් ආදායම් සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්හි පිළිවෙලින් සියයට 19කින්, 32කින්, 44කින් හා 25කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.31,152ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.6,663ක් වූ වරිපනම් ඒකක 16ක් ඇතුළත් වී තිබුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දියුණු ගම් ප්‍රදේශ ලෙස 2018 වර්ෂයේදී හඳුනාගත් ප්‍රදේශ 03කින් වරිපනම් බදු අය කර ගැනීම සඳහා එම කලාප සිතියම්ගත කර ගැසට් කිරීමට හා දේපල තක්සේරු කිරීමට 2024 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති රු.6,916,759ක හිඟ ජල ගාස්තු ආදායමින් රු.5,716,687ක් 2025 මාර්තු 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

### 2.2.4 කුලී

ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රාවණාකන්ද නියගමලහේන මාර්ගයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් සභාව සතු ටොන් 01 ගල් රෝල මාර්ග සංවර්ධන අධිකාරියේ පාගල්ඕවිට වැඩ ඒකකය වෙත 2023 වර්ෂයේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී ගාස්තු අය කිරීමකින් තොරව ලබා දී තිබීම හේතුවෙන් රු.396,500ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.13,250,971කින් රු.13,085,471ක් සහ උසාවි දඩ රු.3,762,662ක් 2025 මාර්තු මස අවසන් වන විටත් ලැබී නොතිබුණි.

### 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ගලගම සංචාරක ගිමන්හල විධිමත්ව තක්සේරු කිරීමකින් තොරව රු.40,000ක මාසික බදු වටිනාකමකට 2023 මාර්තු 01 සිට වර්ෂ 05ක කාලයක් සඳහා විධිමත් අනුමැතියකින්ද තොරව බදු දී තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා 2022 අප්‍රේල් සිට 2022 නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු රු.367,600ක හිඟ මුදල් 2025 අප්‍රේල් වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 10(6) වගන්තිය ප්‍රකාරව, ගොඩනැගිලි අයදුම්කරු විසින් සංවර්ධන බලපත්‍රයක කාලසීමාව දීර්ඝ කරන ලෙස මුදල් ගෙවා කරන ලද ඉල්ලීමකට අනුව උපරිම වසර 02ක කාලයක් දක්වා දීර්ඝ කරනු ලබන අවස්ථාවකදී හැර උක්ත පනතේ 10(5) වගන්තිය ප්‍රකාරව, සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය වර්ෂයක් වුවත්, 2021,2022 හා 2023 වර්ෂවලදී අනුමත කරන ලද වලංගු කාලසීමාව අවසන් වී නැවත දීර්ඝ කර නොගත් සංවර්ධන බලපත්‍ර සංඛ්‍යාව පිළිවෙලින් 35, 24ක් සහ 11 විය. එමෙන්ම, සභාව විසින් අනුමත කර ඇති ගොඩනැගිලි සැලසුම්වලට සාපේක්ෂව නිකුත් කරන ලද අනුකූලතා සහතික ප්‍රමාණය අවම මට්ටමක පැවති අතර, අනුකූලතා සහතික ලබා ගැනීමකින් තොරව අදාළ ගොඩනැගිලිවල පදිංචි වීම සිදුකර තිබේද යන්න පිළිබඳව සභාව පසුවිපරම් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා උප කාර්යාලය සහ ග්‍රාම නිලධාරී කාර්යාලය, ආයුර්වේද සායන, පුස්තකාලය සහ පෙර පාසල යන කාර්යයන් සඳහා පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.42,000,000ක් වැය කර ඉදිකල ගලගම බහුකාර්යය ගොඩනැගිල්ල සභාවට භාරගත් 2016 වර්ෂයේ සිටම අරමුණුගත කාර්යයක් වෙනුවෙන් යොදවා නොතිබුණි. පසුව එහි වටිනාකම තක්සේරු කිරීමකින් හා ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2022 ජනවාරි 11 දින රු.100,000ක මාසික කුලී වටිනාකමකට පෞද්ගලික ආයතනයක් වෙත විධිමත් කුලී ගිවිසුමකින් තොරව කුලියට දී තිබුණි. 2022 ජුලි 11 දින ගිවිසුම අවසන්ව තිබුණද, කුලීකරු විසින් 2023 ජුනි දක්වා ගොඩනැගිල්ල සභාව වෙත භාර දී නොතිබුණි. නමුත් එම මාස 11ක කාලය සඳහා අයවිය යුතු කුලී රු.1,100,000ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 1200-1500ත් අතර ප්‍රමාණයක් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාමට නිදහස් කරන මෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලා තිබුණද, ඒ සඳහා නිදහස් කළ නොහැකි බව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් දන්වා තිබුණි. ඒ වන විටත් යථෝක්ත ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයන්ට හෝ ආදායම් උත්පාදනයට යොදා නොගෙන නිෂ්කාර්යයව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

කැපොක්වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමට අදාළව රු.1,179,374ක් වැය කර 2018 පෙබරවාරි 28 දින ඉදිකර තිබුණු ක්ෂීරිත පද්ධතිය (Leachate Treatment System) වසරක පමණ කාලයක සිට අක්‍රියව පවතින බැවින් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ අප ජලය රැස්වන පළමු ටැංකිය තුළින් උතුරා ගොස් අසළ පිහිටි ඉඩමකට ගලාගෙන ගොස් තිබුණි. එමෙන්ම, එම ව්‍යාපෘතියේ අප ජල ටැංකි පද්ධතියෙහි මෝටර් කාමරය තුළ සවිකර තිබුණු රු.26,301ක් වටිනාකමැති විදුලි වතුර මෝටරය (lph, 1Hp 5 Amp, 80 ft head) 2022 ඔක්තෝබර් 12 දින සොරකම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුව තිබුණු පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2016 වර්ෂයේ සිට ඉදිරියට එන හිඟහිටි ක්‍රියාත්මක ආදායම් හා ජල සැපයුම් ගාස්තු රු.1,065,864ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්ත**

(i) ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුර 2022 දෙසැම්බර් 31 දින සිට පුරප්පාඩුව පැවතුණු අතර, ද්විතියික සේවා මට්ටමට අයත් තාක්ෂණික සේවා නිලධාරී (සිවිල්) තනතුරක් තාක්ෂණ සහායක තනතුරක් හා පුස්තකාලාධිපති තනතුරක් හා ආදායම් පරීක්ෂක තනතුරක් පුරප්පාඩුව පැවතිණි.

(ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත ප්‍රාථමික සේවා මට්ටමේ රියදුරු තනතුරු 05ට අමතරව ස්ථිර රියදුරු තනතුරු 01ක් සහ කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් රියදුරු තනතුරු 01ක් සභාවේ සේවා නියුක්ත කර තිබුණද, එකී තනතුරුවල අවශ්‍යතාව සමාලෝචනය කර අනුමත කරවා ගෙන නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 71 වගන්තිය ප්‍රකාරව, සභාව මඟින් පාලනය කරනු ලබන පෙර පාසැල් 02 සඳහා පෙර පාසැල් පාලිකා තනතුරු 02ක් අනුමත කර ගැනීමට 2025 අප්‍රේල් 29 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක ණය

ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4.5, 4.6 හා 6.3 වගන්ති ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2018 පෙබරවාරි 26 දින මියගොස් ඇති නිලධාරියෙකුගේ රු.143,367ක් හා 2021 නොවැම්බර් 24 දින මිය ගොස් ඇති නිලධාරියෙකුගේ රු.181,074ක් වූ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එංජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් කළ යුතු වුවත්, සභාව සතු වාහන 05ක ඉන්ධන දහන පරීක්ෂාව එපරිදි සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් වාටා ලොරි රථය 2017 ජූනි 16 දින සිදු කළ විධිමත් ඉන්ධන දහන පරීක්ෂාව අනුව ඉන්ධන ලීටර් 01කට ධාවනය කල හැකි කිලෝමීටර් ප්‍රමාණය 9.3ක් සහ 2024 අප්‍රේල් 19 දින සිදුකල විධිමත් ඉන්ධන දහන පරීක්ෂාවට අනුව ඉන්ධන ලීටර් 01කට ධාවනය කල හැකි කිලෝමීටර් ප්‍රමාණය 9.4ක් විය. නමුත් 2023 සැප්තැම්බර් 20 දින ලොරි රථයේ රියදුරු විසින් ධාවන සටහනේ සටහනක් යොදමින් ඉන්ධන ලීටර් 01කට ධාවනය කලහැකි කිලෝමීටර් ප්‍රමාණය 6.3ක් ලෙස දක්වා 2023 සැප්තැම්බර් 20 දින සිට 2024 අප්‍රේල් 10 දින දක්වාම ධාවන සටහනේ ඉන්ධන තුලනය එම ආකාරයට සිදුකර තිබුණි. මෙ හේතුවෙන් එම කාලය තුළ භාවිතා කළ ඉන්ධන ප්‍රමාණය වූ ලීටර් 373.94ක් සැලකීමේදී ධාවනය කල හැකිව තිබූ කිලෝමීටර් ප්‍රමාණය 3,478ක් වුවත්, ධාවනය කර ඇති කිලෝමීටර් ප්‍රමාණය 2356ක් වීමෙන් රු.42,334ක් වූ ඉන්ධන ලීටර් 120.64ක ප්‍රමාණයක් වැඩිපුර භාවිතා කර ඇති බව නිරීක්ෂණය වුවද, ඒ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 30කට අදාළව එකතුව රු.15,737,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 41කට අදාළව එකතුව රු.17,453,688ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

## 4.2 නොවිසඳී ඇති විගණන ඡේද

පඹගින්න සතිපොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හි දී රු.4,561,397ක් වැයකර තිබුණ ද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධන කටයුතු සිදුකර නොතිබුණි. 2023 වර්ෂයේ අයවැය ලේඛනයෙන් පඹගින්න හා පින්නවල සතිපොළ සංවර්ධනය කිරීම සඳහා රු.1,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළදී ද අදාළ අරමුණු කරා ළඟාවීමට සභාව අපොහොසත් වී තිබුණි.

ඩබ්.වී.ඒ.එස්. පුෂ්පකුමාරි,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

ඩබ්ලිව්.වී.ඒ.එස්. පුෂ්පකුමාරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

(06). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(vii). තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය බවට සඳහන් කර ඇති, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එල්.ඩී.ආරියලතා මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.එල්. කුලරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

2025/06/19 වන දින ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VIII සභා වාරයේ පළවන මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ පළවන මාසික මහ සභා වාර්තාවේ යථා පරිදි කල් දී ඇති යෝජනා (06) (vii) හි උද්ධෘතයකි.

ලේකම්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව,
මොරහැල,
බලංගොඩ.

ජේ.පී.එස්.වික්‍රමසිංහ
ලේකම්
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව
මොරහැල, බලංගොඩ